# කෝට්ටේ යුගයේ සාහිත්‍යධරයන් පිළිබඳ කෙටි විමසුමක්

කනංගමුවේ රාහුල හිමි

**Abstract**

A brief analysis of the literati involved in literature during the Kingdom of Kotte will be studied in this article. It could be identified that numerous lay and clerical writers flourished in this era. Different opinions have been expressed regarding the literati active in literature during this period. Some consideration is given to these views as well. Attention is also placed on the literary works authored by both lay and clerical writers. Accordingly, the focus will be directed toward religious scholars such as Veedagama Thero, Rahula Thero, Vattewe Thero, Sumangala Thero and Dharmakirthi Thero, Thilakapirunpathy Thero as well as lay writers such as Nannoorthunayar, Sri Ramachandra, Kavibharathi.

**Keywords:** Kingdom of Kotte, literati opinions, literary works, Veedagama Thero

**ප්‍රමුඛ පදඃ** කෝට්ටේ රාජධානිය, වියත් අදහස්, සාහිත්‍ය නිර්මාණ, විදාගම හිමි

**ප්‍රවේශය**

සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයේ දක්නට ලැබෙන හත් වැනි යුගය කෝට්ටේ යුගය යි. එය සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස විචාරකයෝ පෙන්වා දෙති. එවක සාහිත්‍යකරණයේ නියුක්ත වූ විද්වතුන් රාශියක් වැඩ සිටීම එම යුගය ස්වර්ණමය යුගයක් වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකයකි. මේ යුගයේ පැවිදි ලේඛකයන් මෙන් ම ගිහි ලේඛකයන් ද සාහිත්‍යකරණයේ යෙදුණු බව පෙන්වා දිය හැකි ය. සාමාන්‍ය ගෘහස්ථයන් පමණක් නො ව

රාජකීයන් පවා සාහිත්‍යකරණයේ නියුක්ත වීම සහ සාහිත්‍යකරණය දියුණු ව කෙරෙහි අතහිත දීමත් මේ යුගයේ සාහිත්‍ය දියුණු තත්ත්වය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක ලෙස දැක්විය හැකි ය. එම යුගයේ සාහිත්‍යකරණයේ නියුක්ත වූ සාහිත්‍යධරයන් කවු ද ඔවුන්ගේ සාහිත්‍ය කෘති මොනවා ද යන්න මෙහි දී අවධානයට පාත්‍ර වේ.

**පර්යේෂණ ගැටලුව**

කෝට්ටේ යුගයේ සාහිත්‍යකරණයේ නියුතු වූ ඇතැම් ලේඛකයන් පිළිබඳ ව ඉදිරිපත් වී ඇති සංදිග්ධතා උපදවන අදහස් පිළිබඳ ව විමසීම.

**පර්යේෂණ අරමුණු**

මෙම පර්යේෂණයේ දී අධ්‍යයනයට නතු කරන්නේ කෝට්ටේ යුගයේ සාහිත්‍යකරණයේ නියුතු වූ සාහිත්‍යධරයන් පිළිබඳ ව ය. එම ලේඛකයන් විසින් රචනා කරන ලද ගද්‍ය හා පද්‍ය කෘති මොනවා ද යන්න අවධානයට නතු කෙරෙයි.

**පර්යේෂණ ක්ෂේත්‍රය**

සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යයේ කෝට්ටේ යුගයට කේන්ද්‍ර ව මෙම අධ්‍යයනය සිදු කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙහි දී භාවිත කරනුයේ පුස්තකාලය අධ්‍යයන ක්‍රමවේදය යි.

**වීදාගම හිමිවරු**

මේ යුගයේ වීදාගම යන ග්‍රාම නාමය සහිත හිමිවරුන් දෙදෙනෙකු පිළිබඳ තොරතුරු හමු වේ. මෙම හිමිවරුන් දෙදෙනාගෙන් මහා වීදාගම හෙවත් පළමු වීදාගම හිමියන් පළමු ව වැඩ සිටි හිමියෝ වෙති. මහ වීදාගම හිමියන් කෝට්ටේ යුගයේ උදාවටත් පෙර සිට ම සාහිත්‍ය පෝෂණයෙහි ලා දායක වූ බව ඇතැමෙක් පෙන්වා දෙති (**වික්‍රමසිංහ, 2008:99**). හයවන පරාක්‍රමබාහු රජතුමා කුඩා

අවධියේ රැකවරණ ලබා දෙමින් සිංහාසනාරූඪ වීමට අවශ්‍ය පසුබිම සකස් කර දෙන ලද්දේ උන් වහන්සේ විසිනි (**සුරවීර, රාජාවලිය, 1997:217**). උන් වහන්සේ වීදාගම වෙහෙරෙහි ම වැඩ විසූ හ. උන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ පිළිබඳ ව සඳහන් නො වේ. එසේ වුවත් එලු අත්තනගලු වංශය උන් වහන්සේගේ දෙසුමෙන් එලු අත්තනගලු වංශය නමින් උන් වහන්සේගේ ශිෂ්‍යයකු ලේඛනාරූඪ කිරීම විශේෂ කාරණයකිග (**සන්නස්ගල, 1961:280-281**). මෙම කෘතිය රචනා කරන සමය වන විට පළමු වීදාගම හිමියෝ හෙවත් මහවීදාගම හිමියෝ සංඝරාජ යන පදවියෙන් පිදුම් ලැබූහ (**එම. 1961:281**). වීදාගම යන නමින් හඳුන්වන දෙවැන්නා වීදාගම මෛත්‍රී හිමියෝ ය. උන් වහන්සේ වීදාගම විහාරස්ථානයේ ම වැඩ විසූ බව ලෝවැඩ සඟරාව (**ලෝවැඩ සඟරාව, 2469; 139 කවිය, 290**). බුදු ගුණාලංකාරය (**බුදු ගුණාලංකරය, 2005; 611, කවිය**). කාව්‍ය ලක්ෂණ මිණිමාලාව (**කාව්‍ය ලක්ෂණ මිණිමාලාව, 2005: 86 ගීය 48**). යන කෘතිවලින් තහවුරු වේ.

උක්ත තොරතුරු අනුව වීදාගම මෛත්‍රී හිමියෝත්, විදාගම විහාරස්ථානයේ වැඩ විසූ බව ප්‍රත්‍යක්ෂ කරගත හැකි ය. වීදාගම හිමියන්ගේ පැවිදි නාමය දීපංකර බවත් උන් වහන්සේ උපසම්පදාවේ දී මෛත්‍රී යන නාම ග්‍රහණය කළහ (**පඤ්ඤාශේඛර සහ සේනක, 1984:16**). දෙවන වීදාගම කවිකාර වීදාගම යනාදී අන්‍ය නාමවලින් ද මෛත්‍රී හිමියෝ ජනයා අතර ප්‍රසිද්ධියට පත් වූහ. (**වික්‍රමසිංහ, 2005:101**). උන් වහන්සේ විසින් වීදාගම විහාරස්ථානයේ ආධිපත්‍ය හොබවන ලද බව දක්වා නැත. උන් වහන්සේ දක්වා ඇත්තේ තමන් වීදාගම විහාරස්ථානයේ වැඩ වාසය කරන බව පමණි. ලෝවැඩ සඟරාව (**ලෝවැඩ සඟරාව, 2469: 139 කවිය, 290**). බුදු ගුණාලංකාරය (**බුදු ගුණාලංකරය, 2005: 611, කවිය, 305**). හා කාව්‍ය ලක්ෂණ මිණිමාලාව (**කාව්‍ය ලක්ෂණ මිණිමාලාව, 2005: 86 ගීය 48**). යන ග්‍රන්ථාගත තොරතුරුවලින් ද තහවුරු වන්නේ වීදාගම හිමියන් වීදාගම විහාරස්ථානයේ වැඩ විසූ බව පමණි. උන් වහන්සේ එහි ආධිපත්‍ය දැරූ බවක් සඳහන් නො වේ. එහෙත් ඇතැමෙක් උන් වහන්සේ ශ්‍රී සරණානන්ද පිරිවෙනේ අධිපති තනතුර හෙබ වූ බව පෙන්වා දෙති (**පඤ්ඤාශේඛර හිමි සහ සේනක, 1984:16**). එහෙත් කිසිම මූලාශ්‍රයක උන් වහන්සේ වීදාගම පිහිටි ශ්‍රී සරණානන්ද පිරිවෙනේ ආධිපත්‍ය දරන ලද බව සඳහන් නො වේ (**වික්‍රමසිංහ, 2005:101**). වීදාගම හිමියන්

පළමු ව ලෝවැඩ සඟරාව ද දෙවනු ව හංස සන්දේශය ද තෙවනු ව කව් මිණි ලකුණ ද අවසන බුදුගුණාලංකාරය රචනා කරන ලද බව කේ. ඩී. පී. වික්‍රමසිංහ පෙන්වා දෙයි (**වික්‍රමසිංහ, 2005: 348-356**). කෙසේ වෙතත් හංස සන්දේශයේ කතුවරයා පිළිබඳ උගතුන් අතර මතවාද දෙකක් දක්නට ලැබේ. එයින් රත්මලානේ ධර්මාරාම හිමියෝ හංස සන්දේශයේ කර්තෘත්වය මුඛපරම්පරාගතව සම්මත වී ඇති අයුරින් පවරන්නේ වීදාගම හිමියන්ට ය (**හංස සන්දේශය, ධර්මාරාම, 1902: සංශෝධනය I**).

''ඇතැම් විට වීදාගම පරපුරේ කිවියෙක් හංස සන්දේශය කළා විය හැකි ය. පසු ව බුදුගුණාලංකාරය කර්තෘ වූ මෛත්‍රෙය මහාස්ථවිර පාදයන්ගේ කාලයෙහි ඇතැම් අමුතු කවි හා යට දක්වන ලද අවසාන කවිත් පොතට එක්කර සකස් කොට එය නැවත පිටපත් කරන ලද්දේ යයි ගත හැකි ය'' (**ගොඩකුඹුර හංස සන්දේශය, 1953:xiv**).

ගොඩකුඹුර ඉදිරිපත් කරන අදහස අවධානයට පාත්‍ර කළ යුත්තකි. වීදාගම යන නමින් හිමිවරුන් කිහිප නමක් ම වැඩ සිටි බව තහවුරු කරගත හැකි ය. එනම් සිය පරපුරේ හෝ සිය ගුරු කුලයේ ජ්‍යෙෂ්ඨයාගේ නාම ග්‍රහණය භික්ෂු පරපුරේ පිළිගත් සම්ප්‍රදායකි. පළමු වීදාගම හිමියන්ගේ මෙන් ම දෙවන වීදාගම හිමියන්ගේ ද මුල් නමට වඩා භාවිත වී ඇත්තේ වීදාගම යන නාමය යි. ඒ අනුව සිය නාමය යටපත් කොට පරම්පරාවේ නාමය ඉස්මතු කරනු කැමති යතිවරයෙකු විසින් මේ කෘතිය රචනා කරන ලද්දේ දැයි විමසිය යුතු ය. එසේ නො වේ නම් කවිකාර වීදාගම හිමියන් පිළිබඳ ප්‍රසාදයෙන් සිටි අයෙකු තමන් රචනා කරන ලද කෘතිය වීදාගම හිමියන්ගේ නාමයට පවරමින් සිය සම්ප්‍රදායේ ශ්‍රේෂ්ඨයා ඇගයීම සිදු කර ඇත් දැයි විමසිය යුතු ය. මෙලෙස සිදු කළ ස්ථාන සංස්කෘතයේ බහුල ව දක්නට ලැබේ. මහා කවි කාලිදාස ඉතා ජනප්‍රිය කවියා නිසා පශ්චාත්කාලීන කතුවරු කෘති රචනා කරමින් කාලිදාසගේ නමට පැවරූහ. මෙයින් සිය ගුරුකුලයේ ශ්‍රේෂ්ඨතමයාට ගෞරව කිරීම මෙන් ම එම ගෞරවය තමාට ලබා ගැනීම ද අපේක්ෂා කළ බව දක්නට ලැබේ. මේ පදනමේ සිට හංස සන්දේශය රචනා කළ කතුවරයෙක් විසින් වීදාගම හිමියන්ගේ නමට හංස සන්දේශයේ කර්තෘත්වය පැවරුවේ දැයි විමසීම උචිත ය.

වීදාගම හිමියන් රචනා කරන ලද ලෝවැඩ සඟරාවල බුදුගුණාලංකාරය, කව්ලකුණු මිණිම, යන කෘතිවල අවසානයේ දී ඒවායේ කතුවර නාමය ලෙස වීදාගම හිමියන්ගේ නාමය සටහන් කොට ඇතත් හංස සන්දේශයේ ඇතැම් පිටපතක පමණක් කතුවරයා පිළිබඳ සඳහන් වන කවි තුනක් දක්නට ලැබේ. එම කවි තුන පශ්චාත් කාලීන එකතු කිරීමක් බව ගොඩකුඹුර (**ගොඩකුඹුර, 1953:XIV**). පෙන්වා දෙයි. එසේ ම හංස සන්දේශයේ කර්තෘ අවිනිශ්චිත බවත් එය වීදාගම හිමියන්ගේ කෘතියක් යන මතය සර්වසම්මත නොවන බවත් දක්වති. (**පඤ්ඤාකිර්ති හිමි, 1959:60**). හංස සන්දේශයේ සමාජ දේශපාලන පසුබිමත් සමාජීය ආගමික දෘෂ්ටියක් වැනුම් මගත් බස් වහරත් විමසන සිරි තිලක සිරි මෙහි කර්තෘත්වය වීදාගම හිමියන්ට පැවරිය හැකි බව පෙන්වා දෙයි (**සිරි තිලක සිරි හංස සන්දේශය, 2012:14**). කාලීන සමාජයේ ව්‍යාප්ත වී ජනප්‍රිය ව තිබූ හින්දු ඇදහිලි විශ්වාස පද්ධතිය ඉතා නිර්දය ලෙස විවේචනයට ලක් කරමින් බෞද්ධ සම්ප්‍රදාය තහවුරු කිරීමට ප්‍රෝත්සාහී වූ යතිවරයෙකු ලෙස හඳුනාගත හැකි ය.

**ශ්‍රී රාහුල මා හිමි**

කෝට්ටේ සමයේ ශ්‍රේෂ්ඨ ම පඬිවරයා ලෙස තොටගමුවේ ශ්‍රී රාහුල මා හිමි හඳුන්වා දිය හැකි ය. උන් වහන්සේ පිළිබඳ උන් වහන්සේ විසින් රචනා කරන ලද කෘතිවල ම තොරතුරු රාශියක් අන්තර්ගත වී තිබේ. රාහුල හිමියන් තොටගමු විහාරයේ විසූ බව පඤ්චිකාප්‍රදීපයේත් (**මොග්ගල්ලාන පඤ්චිකා ප්‍රදීපය, 1896:168**). පරෙවි සන්දේශයේත් සඳහන් වේ. පඤ්චිකා ප්‍රදීපයේ කර්තෘ සන්දර්ශයට අනුව උන් වහන්සේ කුඩා අවදියේ දී පරාක්‍රමබාහු රජතුමා පුත්‍ර ප්‍රේමයෙන් ඇති දැඩි කළ බව සඳහන් කොට තිබේ (**මොග්ගල්ලාන පඤ්චිකා ප්‍රදීපය, 1896:168**).

කාව්‍ය ශේඛරයේ කර්තෘ නාම සන්දර්ශනයට අනුව ද තහවුරු වන්නේ රාහුල හිමියන් තොටගමු විහාරයේ ආවාසික වූ බව යි (**කාව්‍ය ශේඛරය ධර්මාරාම හිමි, 1966:23 පද්‍ය 10**). මේ කෘතිත්‍රයට අනුව ශ්‍රී රාහුල හිමියන් එහි අධිපති භාවයට පත් වූ බවක් නො පෙනේ. උන් වහන්සේ එහි ආවාසික වූ බව පමණක් තහවුරු කරගත හැකි ය.

එහෙත් සැළලිහිණි සන්දේශයට රචනා කරන ලද පුරාණ සන්නයට අනුවත් (**සැළලිහිණි සන්දේශය, ධර්මාරාම, 2018:111 පද්‍ය 186**). කාව්‍ය ශේඛරයට අනුවත් (**කාව්‍ය ශේඛරය ධර්මාරාම හිමි, 1966:25 පද්‍ය 10**). උන් වහන්සේ තොටගමුවේ තිබූ විජය බා පිරිවෙනේ ආධිපත්‍ය හෙබ වූහ. ත්‍රිපිටකය මැනවින් දත්හ (එම). ශ්‍රී රාහුල මාහිමියෝ දෙමටාන නම් ගමේ කඳවුරු කුලයේ උපන්හ. (**සැළලිහිණි සන්දේශය, ධර්මාරාම, 2018:111 පද්‍ය 186**). (**කාව්‍ය ශේඛරය ධර්මාරාම හිමි, 1966:23 පද්‍ය 10**). උන් වහන්සේ කාව්‍ය නාටක මාගධ සංස්කෘත ආදි භාෂා දත් බව පරෙවි සන්දේශයේ දක්වා ඇත (**පරෙවි සන්දේශය, සිරි තිලක සිරි, 2014:208 පද්‍ය, 422**). උන් වහන්සේ ෂඩ් භාෂා පරමේශ්වර භාවය සැළලිහිණි සන්දේශයේ ද දක්වා ඇත. (**සැළලිහිණි සන්දේශය, 2018: 111 පද්‍ය 186**). සිය කෘතිවල තමන් සුර ගුරු වන් බව ඉතා පැහැදිලි ව දක්වා ඇත (**සැළලිහිණි සන්දේශය, ධර්මාරාම, 2018: 111 පද්‍ය 186**), (**කාව්‍ය ශේඛරය, 1966: 24 පද්‍ය, 10**).

තොටගමුවේ රාහුල හිමි උතුරු මුල හිමියන්ට මුනුබුරු වන බව දක්වා ඇත (**කාව්‍ය ශේඛරය, 1966: 23 පද්‍ය 10**). තත් කාලීන විදග්ධයන් අතර තමන් වහන්සේ ඉහළින් ම වැජඹුණු බව සිය කෘතිවල දක්වා ඇත (එම). (**සැළලිහිණි සන්දේශය, 2018: 111 පද්‍ය 186**). පරෙවි සන්දේශයේ දී දක්වන අකාරයට වයස පහළොවේ දී කඳකුමරුගෙන් වරය ලත් බවත් දක්වා ඇත (**පරෙවි සන්දේශය, සිරි තිලක සිරි, 2014: 208 පද්‍ය, 422**). රාහුල හිමියන් විසින් රචනා කරන ලද පළමු කෘතිය පරෙවි සන්දේශය යි. එහි දී සිය රාජකීය භාවය ද ඉස්මතු කරමින් භාෂා සාහිත්‍යයේ නිපුණ බව දක්වමින් ස්වකීය රාජකීයත්වය ද ඉස්මතු කර ඇත (**පරෙවි සන්දේශය, සිරි තිලක සිරි, 2014: 208 පද්‍ය, 422**). රාහුල හිමියන්ගේ දෙමව්පියන් පිළිබඳ කිසි තැනක සඳහන් නොවෙතත් උන් වහන්සේගේ පියා මෞර්ය වංශයට අයත් බන්ධවාර කුලයේ වික්‍රමබාහු නම් කුමාරයෙකු බවත් මව සීලවතී නම් කාන්තාවක බවත් කේ.ඩී.පී. වික්‍රමසිංහ පෙන්වා දෙයි (**වික්‍රමසිංහ, 1961:322**). රාහුල හිමියන්ගේ ගුරුවරයා වීදාගම හිමියන්ය (එම. 325). රාහුල හිමියන් සිය පාණ්ඩිත්‍ය පිළිබඳ තමන් විසින් රචනා කරන ලද ග්‍රන්ථවල දක්වා ඇති තොරතුරු සමකාලීන ව රචනා වූ ගිරා සන්දේශයෙන් ද තහවුරු වේ (**ගිරා සන්දේශය 2011: 232 පද්‍ය 27**). රාහුල හිමියන් පරෙවි, සැළලිහිණි, කාව්‍ය ශේඛරය, පඤ්චිකා ප්‍රදීපය

යන කෘති රචනා වූ සමයේ සංඝරාජ පදවිය ලබා නො තිබිණ. උන් වහන්සේ පිළිබඳ ගුණ වැයුම් සිදු කරන ගිරා සන්දේශය මෙන් ම සැළලිහිණි සන්දේශයෙන් ද රාහුල හිමියන් සංඝරාජ වූ බවක් දක්වා නැත. උන් වහන්සේ සංඝරාජ යනුවෙන් තමන් හඳුන්වා ඇත්තේ පද සාධන ටීකාවේ පමණි. රාහුල හිමියන්ගේ චරිතය හා බැඳුණු ජනශ්‍රැති රාශියක් ඇත. වෑත්තෑවේ හිමිල ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරතිල විල්ගම්මුල හිමි, සුමංගල යති හා ජෝතිපාල හිමි රාහුල හිමියන්ගේ ශිෂ්‍යයෝ වෙති. (**මෙලියස් සිල්වා, 1965ඃ 63-68**).

**වෑත්තෑවේ හිමි**

කෝට්ටේ යුගයේ වැඩ සිටි සාහිත්‍යකරුවෙකු ලෙස මුන් වහන්සේ හඳුනා ගැනේ. තොටගමුවේ රාහුල මා හිමියන් වෑත්තෑවේ හිමියන්ගේ ආචාර්යවරයා බව ජනශ්‍රැතියේ ඇත. කර්තෘ අඥාත ගුත්තිල කාව්‍යයේ කතෘ වෑත්තෑවේ හිමියන් බව මුඛපරම්පරාගත ව ප්‍රචලිත ව ඇත (**සිරි තිලක සිරි, 2006ඃ xi**). ගුත්තිල කාව්‍යයේ කිසිදු තැනක වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍යයේ කතුවරයා බව සඳහන් කොට නැත. එහෙත් සිය ගුරුවරයා වූ රාහුල හිමියන් සමඟ ඇති වූ අමනාපයක් නිසා ගුත්තිල ජාතකය පදනම් කොටගෙන ගුත්තිල කාව්‍ය රචනා කොට ඇති බව මුඛපරම්පරාගත ව එයි. වෑත්තෑව යනු උන් වහන්සේගේ ග්‍රාම නාමය යි. එය සත් කෝරළයේ පිහිටා ඇත (**අමරමෝලි 1954ඃ11**).

සත් කොරළේ දිසාවේ කටුගම්පල හත්පත්තුවේ වෑත්තෑව නම් ගමේ දුග්ගන්නා වලව්වේ අප්පුහාමි නමැති මේ ළමයා පැවිදිව තොටගමුවේ විජයබාහු පරිවේණාධිපති ෂඩ්භාෂා පරමේශ්වර ශ්‍රී රාහුල මාහිමියන් වහන්සේ වෙත ශාත්ත්‍රෝද්ග්‍රහණය කරමින් ව්‍යක්ත ශිෂ්‍යයෙක් ව සිටියේ ය. කිසියම් කරුණකින් ගුරුන් වහන්සේ සමඟ අමනාප වී මේ ග්‍රන්ථය නිමවා උපැවදි වී තමන් ගෙතු මේ කාව්‍යය ජයපාල මැතිඳුගේ මාර්ගයෙන් මහවාසලට ඔප්පු කළේ ය.

එයින් ප්‍රමුදිත වූ රජතුමා වාහලපටබැඳි මුදියන්සේ යන පටබැඳි නාමය හා ''කොට්ටල් බද්දේ දිසාපති ධුරය ද'' එතුමා වෙත පිරිනැමි ය. කෝදංග නම් සතලිස් අමුණු ගම පමුණුගම් කොටස ද ලැබුණේ ය. මෙතුමා අන්තිම කාලය ගත කළේ ඒ ගමේ ම පදිංචි වී

සිටිමින් ය.'' (**අමරමෝලි ගුත්තිල කාව්‍ය, 1954:11**). වැත්තෑව යන ග්‍රාම නාමය විනා උන් වහන්සේගේ පැවිදි නාමය අප්‍රකට ය. ගුරුවරයා වැත්තෑවේ හිමියන්ට පල නොකියා පලා බෙදූ අයුරුත් උන් වහන්සේ සිරිලක අතහැර විදේශගත වූ අයුරුත් ජනයා අතර මුඛපරම්පරාගතව පවතී (**ගුත්තිල කාව්‍ය-දේවරක්ඛිත 1979:11**). එතුමාගේ වාසභවනය වන්නේ ගෙදර වලව්ව ලෙස හඳුන්වන බවත් එම පරපුරින් පැවතෙන පරම්පරාවක් 1916 දක්වා ම පැවති බවත් සඳහන් වේ. (**ගුණවර්ධන 1916:iii**). සලාවත ජයපාල මැතිතුමා පිළිබඳ සඳහන් කොට තිබීමෙන් මෙම කෘතිය ජයවර්ධනපුර යුගයේ දී ම ගුත්තිල කාව්‍ය රචනා කරන ලද බව තහවුරු කරගත හැකි ය. ඇතැමෙක් ගිරා සන්දේශය ද සිරි වැත්තෑවේ හිමියන්ගේ කෘතියක් ලෙස පෙන්වා දෙති. එහෙත් ගිරා සන්දේශයේ හා ගුත්තිල කාව්‍යයේ කාව්‍යවල සමාන බව ම පමණක් සලකමින් ගිරා සන්දේශයේ කර්තෘත්වය වැත්තෑවේ හිමියන්ට පැවරීම යුක්ති යුක්ත නො වේ.

## තිලක පිරිවෙන්පති හිමි

කොවුල් අස්න හෙවත් කෝකිල සන්දේශයේ කතුවරයා දෙව්නුවර තිලක පරිවේණාධිපති ව වැඩ විසූ තිලක හිමියෝ ය. උන් වහන්සේ මුල්කිරිගල විහාරාධිවාසි වූ තෙරුන් වහන්සේගේ බාල සෙහොයුරෙකු බව දැක්වෙන අතර උන් වහන්සේ ඉරුගල්කුල නම් වංශයට අයත් වූහ (**ගුණවර්ධන කෝකිල සන්දේශ වර්ණනා 1962: 292 පද්‍ය 255**). ඉරුගල් කුල යන වංශය උසස් වංශයක් බව එය ද්‍රවිඩ නාමයක් බවත් පෙනෙයි. (**එම, 256**). ඒ හැරුණු කොට මුන් වහන්සේ පිළිබඳ වැඩිදුර තොරතුරු විද්‍යමාන නො වේ. රාහුල හිමියන් පිළිබඳ තිලක පරිවේණාධිපති හිමියන් ඉතා ඉහළින් වර්ණනා කර ඇත. උන් වහන්සේගේ දක්ෂතා ද ඇගයීමට ලක් කොට ඇත (**ගුණවර්ධන 1962:82 පද්‍ය 82**). මේ කාලයේ දී ස්වකීය කුලය ඉස්මතු කිරීම ප්‍රවණතාවක් වී තිබුණු බව පෙනේ. එසේ ම ද්‍රවිඩ කුලවංශ පරම්පරා ඉතාමත් ප්‍රසිද්ධියක් ලබා තිබිණ. තිලක යනු කෝකිල සන්දේශ කතුවරයාගේ නාමය නො ව උන් වහන්සේ ආධිපත්‍ය දැරූ පිරිවෙනේ නාමය යි. උන් වහන්සේගේ පැවැදි නාමය කුමක් දැයි දත නො හැකි ය. දෙව්නුවර සිට යාපාපටුන දක්වා රැගෙන යන සම්භාව්‍ය සිංහල සන්දේශනාවලියේ දක්නට ලැබෙන දීර්ඝතම

සන්දේශය ලෙස මෙය නම් කළ හැකි ය. තිලක පිරිවෙන්පති හිමියෝ ෂඩ්භාෂා පරමේශ්වර යන උපාධියෙන් පිදූහ (**පඤ්ඤාශේඛර හා සේනක 1984:33**). මුන් වහන්සේ ගලතුරු මූල ආයතනයේ ගලතුරු මූල හිමියන්ගේ ශිෂ්‍යයෙකු ලෙස සැලකේ. (**එම, 55**).

**නන්නූර්තුතයා**

නන්නූර්තුතයා විදේශීකයෙකි. හයවන පරාක්‍රම බාහු රජතුමාගේ දියණියක විවාහ කොටගෙන සිටි බව පෙනේ. ඔහු විසින් සිංහල නාමාවලිය නම් කෝෂ ග්‍රන්ථයක් රචනා කොට ඇත (**නාමාවලිය ජයවර්ධන 2004:286 පද්‍ය 100**). නන්නූර්තුතයා චෝළ දේශයෙන් ලංකාවට පැමිණි අයෙකි. සැළලිහිණි සන්දේශයේ ද නන්නූර්තුතයා පිළිබඳ මනා විස්තරයක් කොට ඇත. (**සැළලිහිණි සන්දේශය, 2018:95-96 පද්‍ය 167-168**). නාමාවලියට අනුව ඔහුගේ සම්පූර්ණ නාමය නන්නූර්තුත් මිණි සන්නස් යන්න යි. (**නාමාවලිය ජයවර්ධන 2004:286 පද්‍ය** 100). උත්පත්තියෙන් ද්‍රවිඩයෙකු වුවත් සිංහල භාෂා සාහිත්‍ය පිළිබඳ මනා ප්‍රවීණත්වයක් දැක් වූ අයෙකු ලෙස නන්නූර්තුතයා හඳුන්වා දිය හැකි ය. ඔහු හයවැනි පරාක්‍රම බාහු රජතුමාගේ රාජ සභාවේ අමාත්‍යවරයෙකු ලෙස සේවයේ නියුතු වූ අයෙකි.

**ශ්‍රී රාමචන්ද්‍ර කවිභාරති**

කෝට්ටේ යුගයේ ඇති වූ ආධ්‍යාපනික දියුණු ව දේශ දේශාන්තරවල ප්‍රචලිත විය. එහි ප්‍රතිඵලයක් ලෙස භාරත වැසියෙකු වූ රාමචන්ද්‍ර කවි භාරති ශ්‍රී ලංකාවට පැමිණ විජයබා පරිවේණාධිපති තොටගමුවේ රාහුල හිමියන් වෙතින් ශාස්ත්‍රෝද්ග්‍රහණය කරන ලදි. ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරති පඬිතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථ ත්‍රයකි.

1. වෘත්ත රත්නාකර පඤ්චිකාව
2. භක්තිශතකය හෙවත් බෞද්ධ ශතකය
3. වෘත්තමාලා ව්‍යාඛ්‍යාව

ඔහුගේ බ්‍රාහ්මණ වංශිකත්වයත් ගෞඩ දේශයේ උපන් බවත්

දක්වා තිබේ (**භක්තිශතකය හේවාමානගේ, 2004: 107 ශ්ලෝක 72 පි**). පරාක්‍රමබාහු රජතුමා විසින් ඔහුට බෞද්ධාගම චක්‍රවර්තී යන ගෞරව උපාධිය ප්‍රදානය කොට ඇත (**එම. 73**). ඔහු උත්පත්තියෙන් හින්දු භක්තිකයෙකු වූයේ ය.

### සුමංගල හිමි

සුමංගල හිමියෝ රාහුල මා හිමියන්ගේ ශිෂ්‍යයෙක් වූහ. ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරති විසින් විරචිත බෞද්ධ ශතකයට සන්නයක් සම්පාදනය කරන ලද්දේ මුන් වහන්සේ විසිනි (**භක්තිශතකය හේවාමානගේ, 2004: 74**). භක්තිශතකයේ සන්න කතුවරයාගේ නාමය මංගල යනුවෙන් දක්වා ඇත. එහෙත් කේ.ඩී.පී. වික්‍රමසිංහ භක්ති ශතක සන්නයේ කතුවරයා නියඳවනේ වුස්ස දේව සුමංගල හිමියන් යැයි අනුමාන කරති (**වික්‍රමසිංහ 2008:119**). ඒ අනුව භක්ති ශතක සන්නයේ කතුවරයා ම සටහන් කොට ඇත්තේ මංගල නාමය බව පෙන්වා දිය හැකි ය.

### අනෙක් පඬිවරු

මේ යුගයේ රචනා වූ කුවේණි අස්න නම් ග්‍රන්ථයේ කතුවරයා ෂඩ්භාෂා පරමේශ්වර උතුරුමුල මහතෙරිඳුන් ගම්පොළ යුගයේ අවසාන භාගයේ දී මෙන් ම කෝට්ටේ යුගයේ මුල භාගයේ දී ජීවත් වූ බව ඇතැමෙක් පෙන්වා දෙති (**සන්සන්ගල, 1961: 249**). මේ යුගයේ දී ම හයවන පරාක්‍රම බාහු රජතුමාගේ ඇරැයුමෙන් අන්‍යතර ලේඛකයෙකු විසින් කඨිනානිසංසය නම් කෘතිය රචනා කර තිබේ (**එම. 282**). දහම් ගැට මාලාව නම් කෘතිය කෝට්ටේ යුගයට අයත් වේ. මෙහි කතුවරයා ධර්මසේන නම් හිමි නමකි (**සන්සන්ගල, 1961: 249**). මෙහි සඳහන් වන ධර්මසේන හිමියන් දඹදෙණි යුගයට අයත් වේ දැයි ස්ථිර වශයෙන් කිව නො හැකි බව සන්නස්ගල පෙන්වා දී ඇත (එම). ජනවංශය නමින් මෙවක රචනා වූ කෘතියේ කුලවාදයේ නිසරු බව පෙන්වා දී ඇත. මේ කෘතිය රචනා කොට ඇත්තේ මහා විහාරවංශානුගත ශ්‍රී බුද්ධ රක්ඛිත නම් ස්ථවිරපාදයන් වහන්සේ ය. (**ජනවංශය, 2003:8**) මෙම කෘතිය කෝට්ටේ යුගයේ දී රචනා කොට ඇති බව කේ. ඩී. පී. වික්‍රමසිංහ පෙන්වා දෙයි (**වික්‍රමසිංහ 2008: 165**). කෝට්ටේ යුගයේ දී රචනා කරන ලද ගණිතසිංහ සන්නය කිසියම් ජ්‍යොතිශ්ශාත්‍රඥයෙකු

විසින් රචනා කරන ලදි (**වික්‍රමසිංහ 2008: 168**). මෙවක රචනා වූ එළු සිලෝ සතකයේ කතුවරයා ද අඥාත ය. (**සන්සන්ගල, 1961: 255**). මෙවක රචිත පැරකුම්බා සිරිත ද කර්තෘ අඥාත වූ ග්‍රන්ථයකි (**එම, 272**). වයන්ති මාලය නම් කෘතිය ද වීදාගම ශ්‍රී සිංහල කවිතිලක නම් පඬිවරයෙකුගේ කෘතියකි (**එම. 286**). මෙවක රචනා වූ චූලබෝධිවංසය ද කර්තෘ අඥාත කෘතියකි (**එම. 287**). කැරගල පද්මාවතී පිරිවෙන්පති වූ වනරතන හිමි වටරක්ගොඩ විහාරයේ විසූ මහපියා පිරිවෙන් හිමි ගලතුරුමුල මේධංකර හිමි සප්තරත්න පරිවේණාධිපති රම්මුංගෙ ාඩ දීපංකර හිමි කැලණි විහාරයේ ගණනායක ස්ථානය ලබා සිටි සහ ගතාරා පිරිවෙන්පති වූ බුවනෙක බා හිමි එරබත්තොට ධර්‍මරාජ පරිවේණාධිපති නියදවනේ පුස්ස දේව සුමංගල හිමි පඤ්චමූල පරිවේණාධිපති මංගල හිමි ආදීහු මෙවක සාහිත්‍ය කරණයේ නියුක්ත වූ සාහිත්‍ය ධරයෝ වෙති (**සන්සන්ගල, 1961: 289-290**).

**ධර්මකීර්ති හිමි**

කෝට්ටේ යුගයේ වැඩ සිටි ධම්මදින්නාචාර්ය සිද්ධාර්ථ විමලකීර්ති හිමියෝ ධර්මකීර්ති පරම්පරාව නියෝජනය කළහ. මුන් වහන්සේ විසින් සද්ධර්මරත්නාකරය නම් මා හැඟි ග්‍රන්ථය රචනා කරන ලදී. ගම්පොළ සමයේ සිටි දේව රක්ඛිත ජයබාහු ද්විතීය ධර්මකීර්ති හිමිපාණන් වහන්සේ කෝට්ටේ සමයේ වැඩ සිටි ධම්මදින්නාචාර්ය සිද්ධාර්ථ විමලකීර්ති හිමියන්ගේ ආචාර්ය වරයාණෝ ය. සද්ධර්මරත්නාකරය කෝට්ටේ සමයේ ලියැවුණ ප්‍රශස්ත ම ගද්‍ය ග්‍රන්ථය වෙයි. දේව රක්ඛිත ජයබාහු හිමියන්ගෙන් පසු ව ධම්ම දින්නාචාර්ය ධර්ම කීර්ති හිමියෝ මා හිමි පදවියට පත්වූහ (**වික්‍රමසිංහ 2008: 94-95**). සද්ධර්මරත්නාකරය දක්වන ආකාරයට මුන් වහන්සේ මහදැළියා වංශයට අයත් වූ බව පෙනේ (**සද්ධර්මරත්නාකරය 1 පරිච්ඡේදය** (?)

සම්භාව්‍ය ගද්‍යයෙන් බණ කතා රචනා කිරීමෙහි ලා ධර්මකීර්ති පරපුර ප්‍රමුඛ වේ. මුන් වහන්සේගෙන් පසුව එබඳු ග්‍රන්ථ බිහි වූ බවක් දක්නට නො ලැබේ. පලාබත්ගල ආරණ්‍ය පරිවේණාධිපති ධුරය දැරූ මුන් වහන්සේ ශ්‍රී රාහුල මා හිමියන්ගෙන් පසුව සඟරජ පදවිය දරා ඇත (පඤ්ඤාශේඛර හිමි සහ සේනක, 1985: 28).

## සමාලෝචනය

කෝට්ටේ යුගයේ සාහිත්‍යයකරණයේ නියුක්ත වූ ලේඛකයන් අතර වීදාගම හිමිල තොගමුවේ ශ්‍රී රාහුල හිමිල වැත්තෑවේ හිමිල තිලක පිරිවෙන්පති හිමි හා ධර්මකීර්ති හිමි වැනි පැවිදි ලේඛකයන් රාශියක් හමු වේ. ඒ හැරුණු කොට ගිහි ලේඛකයන් ද සාහිත්‍යකරණයේ නියුක්ත වූ බවට සාධකය එළවිය හැකි ය. නන්නූර්තුනයාල ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී වැන්නවුන් ඒ අතුරින් ප්‍රමුඛ වේ. කෝට්ටේ යුගයේ විසූ බොහෝ කතුවරු ගද්‍ය කරණයට වඩා පද්‍යකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇති බවත් ඔවුන්ගේ කැපවීම හා සාහිත්‍යකරණය නිසා කෝට්ටේ යුගය ස්වර්ණමය සාහිත්‍ය යුගයක් බවට පත් වූ අයුරු නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරවංශ, කොත්මලේ (1968). **සිංහල සාහිත්‍යලතා.** කොළඹ: අගනුවර සාහිත්‍ය සංසදය

ආයර්‍යවංශාභිධාන, ශ්‍රී ස්ථවිර (2005). **කාව්‍ය ලක්‍ෂණ මිණි මාලාව.** බත්තරමුල්ල: රත්න පොත් ප්‍රකාශකයෝ

ආරියපාල, එම්.බී., ජයවික්‍රම, එන්.ඒ., විජේසූරිය, විමල., කුරේ, චන්දන අනුර (2003). **ජනවංශය.** වැල්ලම්පිටිය: චතුර මුද්‍රණාලය

ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ් (1916). **ගුත්තිල කාව්‍ය වර්‍ණනා.** පානදුර: N.J.COOREY & SONS, COLOMBO

ගුණවර්ධන, ඩබ්ලිව්. ඇෆ් (1962). **කොකිල සන්‍දෙශ වර්‍ණනා.** කොළඹ: මහාබොධි යන්ත්‍රාලය

ගුණසේකර, බන්දුසේන (1996). **සිංහල සාහිත්‍ය.** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

ගුණසේකර, බන්දුසේන (1997). **කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය.** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

ගොඩකුඹුරේ, සී.ඊ (1953). **හංසසන්‍දෙශය.** කොළඹ: සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම

ජයවර්ධන, එච්.වී.ජී. සෝමසිරි (2004). **සිංහල නාමාවලිය.** කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

ජයවර්ධන, එස්.කේ., පෙරේරා, නිමල් ආරියවංශ (?). **කෝට්ටේ යුගය.** වැල්ලම්පිටිය: ලස්සන පොත් ප්‍රකාශකයෝ

තිලකසිරි, සිරි (2005). **පරෙවි සන්දේශය.** කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ

තිලකසිරි, සිරි (2008). **සිංහල සන්දේශ කාව්‍යයේ සමාජ පසුබිම.** කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ

තිලකසිරි, සිරි (2011). **ගිරා සන්දේශය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

තිලකසිරි, සිරි (2012). **හංස සන්දේශය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

තිලකසිරි, සිරි (2013). **ගිරා සන්දේශ විමර්ශනය.** කොළඹ: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

තිලකසිරි, සිරි (2013). **සන්දේශ කාව්‍ය සාහිත්‍යය.** කොළඹ: සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

දීපංකර හිමි, වැලිපටන්විල (1910). **මයූර සන්‍දෙශය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ධර්‍මකීර්‍ති හිමි, රත්මලානේ (1902). **හංස සන්‍දෙශය.** කොළඹ: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම

ධර්මබන්ධු, ටී.එස් (2469). **ලෝවැඩ සඟරාව.** කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

ධර්මාරාම හිමි, රත්මලානේ (2018). කැලණිය: **සැළලිහිණි සන්‍දෙශය සහ එහි පුරාතන සන්නය.** විද්‍යාලංකාර ප්‍රකාශන

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ (2009). **හංස සන්දේශය.** කොළඹ: සූරිය ප්‍රකාශකයෝ

පඤ්ඤාසාර හිමි, දෙහිගස්පේ., සහ විමලධම්ම හිමි, පලන්නෝරුවේ (1933). **සාරදීපිකා ගිරා සන්‍දෙස වර්‍ණනා.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

පඤ්ඤාසේකර හිමි, දේවහන්දියේ., සේනක, සිරිමෙවන් (1984). **ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලේඛක තොරතුරු.** ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය

බටුවන්තුඩාවේ, රොබට් (1928). **වෘතතමාලාඛ්‍යාව.** ලංකාභිනවවිශ්‍රැත යන්ත්‍රාලය

බලගල්ලේ, විමල් ජී (1999). **සිංහල සාහිත්‍යය.** පාදුක්ක: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මෛත්‍රෙය මහා ස්ථවිරපාදයන් (1978). **බුදු ගුණ අලංකාරය.** පිටකෝට්ටේ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

වජිරඤාණ හිමි, හොරණ., අභයගුණවර්ධන, වෙ.වී., කාරියකරවන, එඩ්මන්., දිසානායක, විමල්., සුගතදාස, කේ.බී., රුවන්පතිරණ, මොනිකා., අමරදාස, කේ.ජී (1977-78). **සාහිත්‍යය.** කොළඹ: සංස්කෘතාක කටයුතු දෙපාර්තමේන්තුව

වජිරඤාණ හිමි, හොරණ (1992). **සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

වික්‍රමසිංහ, කේ.ඩී.පී (1961). **සිංහල ලේඛක පරපුර**. කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

වික්‍රමසිංහ, කේ.ඩී.පී (1964). **කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය**. මහරගම: තරංජී ප්‍රින්ට්ස්

විමලවංස හිමි, බද්දේගම (1947). **සිංහල ග්‍රන්ථ වංශය**. සාධු මුද්‍රණාලය

ශ්‍රී ධර්මාරාම මහා ස්ථවිර (1935). **කාව්‍යශේඛර මහා කාව්‍යය**. කැලණිය: කැලණිය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල මුද්‍රණාලය

සන්නස්ගල, උපුල් ශාන්ත (2010). **ගිරා සන්දේශය පුරාවෘත්ත විශ්වකෝෂය**. නුගේගොඩ: සංහිද මුද්‍රණ සහ ප්‍රකාශන

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (1961). **සිංහල සාහිත්‍ය වංශය**. කොළඹ: ලේක් හවුස් මුද්‍රණාලය

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (1962). **සිංහල සන්දේශ සාහිත්‍යය**. කොළඹ: ලේක් හවුස් මුද්‍රණාලය

සිරිසුමන හිමි, අගලකඩ (2021). **හංස සන්දේශය සරල සංස්කරණය**. නුගේගොඩ: සී/ස සරසවි ප්‍රකාශකයෝ

සිල්වා, ඇම්. මේලියස් (1962). **ශ්‍රී රාහුල සංඝරාජ චරිතය**. කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම

සේනානායක, ජී.එස්.බී (1978). **හංස සන්දේශය**. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ

සේනානායක, රංජිත්, (2017). **මයූර සන්දේශය ශාස්ත්‍රීය සංස්කරණය**. මාතර: නීට් ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම

හේවමානගේ, විමල් (2004). **භක්තිශතකය**. කොළඹ: සමයවර්ධන පොත්හල (පුද්ගලික) සමාගම